# ගැලවීම

අතුල විජේවික්‍රම

කන්දෙ විහාරයේ
ඝන්ඨා නාදයෙන්
ඇවිලෙන චිත්ත ගිනි නිවා
මෙත් සිසිලෙන් ප්‍රබෝධ වී
ලොව්තුරා බුදුන් දමින්
පිපී සුගන්ධවේ ...

සසර බන්ධනාගාරයෙ
වසඟයට ලොවම හසුවී
සිරවෙලා එහිම දැසිකම්
කරන මනු සතුන්
මිදෙන්නට දුකෙන්
පිළියම් සොයයි නිරතුරුව
නොසොයා ගැලවෙන්නට මග
සසරේ මැරී ඉපදෙමින් ...

කෙලෙස් රෝගයෙන් පෙලෙමින්
අනන්ත දුක් වද විඳිමින්
නිරන්තරව ඉපදේ
අහිමිව ඉමක් සුවක්
විශ්වයේ පැතිර පවතින
දම් ඔසින් බිඳක් නිසි ගෙන
ගෙවන්නන් දිහා බලනව
පසේ බුදුවරුත් ...



# මේ'පුර වර

මානෙල් ගොඩගේ

පර දෙස
විරිතක ගර්වය
මොණර හිසින්
රකිනා ....

අංජන විලවුන්
තවරා...
ඉගිලෙන්නට
තනනා ....

උරුළෑවන්
මාන කොකුන්
දිවා රෑයේ
සරනා ...

මෙපුර වරේ ...
ගැවසෙන් පුත,
නුවණැස මෙහෙය වමිනා...

නුරා ඇසින්
සිත දල්වා
ගිල ගන්නට
බලනා....

ඇඳ දෑසින්,
බමන මතින්,
නිල් කොල මත
රඟනා...

චිංචි මානවිකා
ලඳුන්...
හැම තැන
මුන ගැසෙනා....

මෙ පුර වරේ...
ගැවසෙන් පුත,
එලැඹිව ගිය
හිසිනා...

# ජීවිත සටහන්

| | |
|---|---|
| සුන්දරයි කෙළිදෙලෙන් පසු කලා ලමා | විය |
| තරුණ කල මදනලක් ලෙස උනා හමා | ගිය |
| හිටිගමන් පැණ නැගුන ප්‍රශ්ණ මෙන් | සුනාමිය |
| කිම සිතන්නට කලින් සියලු දෙය | හමාරය |
| ඇහිඳ කැබිලිනි යලිත් එකින් එක එකතු කර | |
| දිවි මැදුර ගොඩ නැගුව නැවත පිලි සකර | කර |
| සැහැල්ලුව සිත්න්නට හුරු වුවත් දිවියෙ බර | |
| දෙන්න විය යුතු කමුයි කියපු දේවලට | උර |
| සුවඳ, රුව ගේනේවිද මල හෙලුව පසු | නටුව |
| ඒ ලෙසින් දිවිය යයි ඉරණමත් හා | කැටුව |
| සිහිවටන පොදි බැඳන් අත්දැකුම් හා | දුටුව |
| පෙරලන්න තව ඇත්තේ දිවියෙ අන්තිම පිටුව | |
| ඉඩ තබා දිවි පෙතෙහි ලියන්නට පෙර | වදන |
| මතු දිනක අරඹන්න කෙලවරක් නැති | ගමන |
| මගේ දිවි කතාවක දන්න මිතුරන් | සිටින |
| ඒ අයෙකු හට තබමි ලියන්නට පෙර | වදන |
| සිහිනයක් ජීවිතය නිදියහනෙ රැය | දකින |
| උදය හිරු වැටුන පසු එය සැබෑවක් | නොවන |
| එකිනෙකා පරයමින් කරන මුත් දිවි | සටන |
| සිතුවාද මතු දිනෙක අපි සැවොම අය | මැරෙන |
| ලන්සුවයි ජීවිතය දු කෙළියෙ ජය | පතන |
| පන්දුවයි ජීවිතය හැම අතින් බැට | වදින |
| සින්දුවයි ජීවිතය නිදි වරාගෙන | නටන |
| පන්හිඳයි ජීවිතය අමර සටහන් | තබන |

## සරත් වීරසේකර

ටොරොන්ටෝ - කැනඩාව

## "ලොව නැල වූ - ලොව හැඬ වූ කුමරිය ඩයනා"

| | |
|---|---|
| රජ පවුලක ඉපිද රජ - සැප විඳ | හැඳුනු |
| නිජබිම හිරුන් නොබසින ලොව නම | රැඳුනු |
| රජකම කිරුළු හිමි කුමරුගේ අන | බැඳුනු |
| රජ කුමරියයි ඇය ඩයනා ලොව | හැඳිනු |
| මොන මොන ගැටලු තිබුනත් රජ ගෙය පැත්තේ | |
| සැනසුම පිරුණු හසරැල්ලකි මුව | ඇත්තේ |
| ලොව දන සමග සුහදව අත් බැඳ | ගත්තේ |
| රජ උණුසුමට නැහැ හිස ලොකු කර | ගත්තේ |
| ගත කල නමුත් දිවියක් සෙල්ලක් | කාර |
| ඇත මුලු ලොවට ඇය කල බොහො උප | කාර |
| සිත රැඳි තරුණ - තරුණියනගෙ උප | හාර |
| නැත අඩු කිසි විටෙක කුමරිට මන | හාර |
| මේ රජ කුමරි වූ මුත් බොහො අනු | රාගී |
| දේපල මුදල් රජ සැප ගැන සිත | නැගී |
| සේවය කලේ දුගි - දන හට ලෙඩ | රෝගී |
| පේවී නැගිටුවා ලු සිටි දන | පැගී |
| බැරි තැන මාලිගාවේ තව දුර | ඉන්න |
| හරි තීරණය ගෙන කුමරා හැර යන්න | |
| සිරි - සැප අතැර නිදහස දෝතට | ගන්න |
| සිරිකත ඇය වුනා ලොව තරුණයො | දන්න |
| කියමින් නොයෙක් අය හා ඇති | සම්බන්ද |
| පොත පත ලියා පල කල ලේඛක | යන්ද |
| නිතරම පසු පසින් ආ කැමරා | වන්ද |
| නැත ගැලවුමක් වුනෙ කුමරිට මන | බැන්ද |
| දිරියක නියත - අනියත බව ලොවට | කියා |
| පිරිසිඳු පැරිස් නගරයෙ සිහිවටන | තිබා |
| ඇය මහ උමං මග තුලදී දෙනෙත | පියා |
| ලොව සුවහසක් නෙතු කඳුලින් බරව | ගියා |

## මල්කාන්ති පටුවනවිතානගේ

චෙරිබෲක්
සිඩ්නි



# ඇය ගිය පසු

| | |
|---|---|
| නැගුනත් අහස හෙළිකර දිනකර | රජිඳු |
| අඳුරැය මගෙ නිවස පහනක් නොමැති | බඳු |
| තරු පිරිවරා ආවත් බැබැළෙන | තරිඳු |
| මගේ හදවතෙහි එලියක් නොපෙනෙයි | කිසිදු |
| පැහැබර මලින් මිදුල ම වී ඇත | සාර |
| බිඟු නද ඇසෙයි නිතරම මොහොතක් | නෑර |
| සමනලියෝ සිටිති එන තෙක් සිය | වාර |
| මගෙ හදවත නොදක්වයි කිසි | ප්‍රතිචාර |
| යාබද නිවසෙ තිබුණත් මියැසියේ | සද්ද |
| මේ ගෙට නොඑයි ඒ මඟින් පිටවෙන | සද්ද |
| අපහට සොබා දහමෙහි අසිරිය | නැද්ද |
| හදවත මගේ තවමත් නිදිබර | වත්ද |
| ජීවිතයෙහි අඩක් මගේ නැතිවුණා | හින්ද |
| ලෝකය මට නපුරු වී එනවද | මන්ද |
| මගේ සහකාරි ගිය පසු සමුගෙන | පසුද |
| රසයක් දැනේවිද යළි දිවියෙහි | කිසිද |
| බුදු හිමියන් ඔබ වදහළ මෙම | දහම |
| ගැලවීමක් තිබෙයි මගෙ දිවියට | හරිම |
| අනියත - අනත්බව දැකගතහොත් | නියම |
| මතු දවසෙක ලැබෙනු ඇත නියත | සැනැසුම |

## සිරිවිමල මුතුකුමාරණ

# මල් දම

ඉසුරු චාමර සෝමවීර



*"තව ද, නො එක් ජාතියෙහි යක්ෂ රාක්ෂාදීන් වෙස් වළා අවුත් මා ම දන් ඉල්ලූ කල ඔවුන්ට මා දන් දුන් කල, ඔවුන් මා සල්ව සල්වා කෑ කල එකල්හි දු මා කිසි දොම්නසක් නො වූ කල්, නො එක් සතුන්ට ගොදුරු නියා මා ම දුන් කල් අසංඛය ගණන් ජාති දකිමි. තව ද සසර නුඹ වහන්සේ මා හැර ගොස් පරස්ත්‍රීන් කෙරෙහි හසුව තවතවව"*
*පූජාවලිය - යශෝධරා අපදානය*

සිඳිම් මල් දම
ඉපැරණී
සෙනේ ගැට දා හිර කළ

පර මල් ය මේ
සුවඳ නැති
එහෙත්
මායා මතක සුවඳකි

සපු ය, සෙව්වන්දි ය,
පරසතු ය, සුසුවඳ කොඳ ය
කිනම් මල් දැයි
කියනු නොහැකිය
ගිලිහෙන්න නියමිත පෙති ය

සියුම් ගැට දා තද කළ
හුයකි බිඳි
නොබිඳෙෂතැයි අප පැතු

ඇනි ඇනී අපමණ කටු
නෙළු මල් ය කඳුළින් දෙවූ
කිසි දා ක පරවෙතැයි
නොම සිතු

පණ ය තවමත් මේ
ඉතිරි අන්තිම මල
එහෙත් අමුණනු නොහැකිය
කෝ කොහිද ඒ හුය ?

boondi.lk

# උපදින සසරෙත් මගෙ ම පියා වී සනසනු මැන මා තුරුලෙ හොවා

මගේ සිතට එන ඔබ ගැන සිතුවිලි
කොපමණ කිව්වත් අප්පච්චි
ලොව ඇති සොඳුරු ම වදන් පෙළත් මදි
ඔබෙ ගුණ ගයන්න අප්පච්චි ..............

මගේ අනාගත දිවිය සදන්නට
ඔබ වෙහෙසෙන හැටි අප්පච්චි
දැක්කම මට හරි පුදුමත් හිතෙනව
ඔබ ගැන මගෙ සුදු අප්පච්චි .........

මෙලොවට ඔබ පිදු ජීවය මා වෙමි
සැනසෙමි ඒ ගැන තුටින් සදා
මා ලද පැසසුම් දිනුමන් හමුවේ
ඔබෙ අභිමානය මා දුටුවා .....

මුලු හදින්ම ඔබ ගුණ ගයන්නෙ සුදු දුව
ඔබ මතු බුදු වෙන්නට ම පතා
උපදින සසරෙත් මගෙ ම පියා වී
සනසනු මැන මා තුරුලෙ හොවා ....

## රනීෂා කරුණාරත්න,

ශ්‍රී සුමනතිස්ස දහම් පාසල,
අස්ගිරි මහාවිහාර මහ පිරිවෙණ,
මහනුවර.



# වසර 98 ක අවසානය තෙක්ම අවදි සිහියෙන් සතුටු දිවියක් ගෙවා 04 ජුනි 2013 මියැදුන මාමණ්ඩියට උපහාර

මාමණ්ඩියනේ සිරුර තබා ගිය
නිදි ගත් සුව යහනේ
සොහොනේ නොදැවෙන සිසිලෙ වෙලි ඈත
බරිත නෙතට සැලෙනා කඳුලින්

අභිලස වී නම් ධන උපයන්නට
පාලක බල මුළු හා වැජඹෙන්නට
ඔබේ සිරුර අද යනු ඇත රථ මත
රන් සිවි ගෙය තුල පේවී දස දෙස

ගිනිගෙන දැවෙනා සිරුරින් පිටවෙන
කලු දුම් දහර තුලින්
රතු දැල්ලක් දිස්විය උඩ අහසේ
ධජයද ඔබ දුටු රජයක හෙළ දෙරණේ

අදිරද බල සතු සමාගමක සුළු
නිලයක තනතුර දරමින් සිටියද
යුක්තියෙ සටනට ඔබ දුන් දිරියට
සැලුනද ලොක්කන් අවංක මිනිසට

තරුණ වියේ පොදු සටනින්
සම ලොව සිහිනේ මල් පල දකිමින්
සිහියේ රැඳවුනු අභිමන් මතකින්
මැයි දින හර සර දුටුවද කඳුලින්

වාදී යථාර්ථ කඳවුරු සේනා
අතරත් ඔබ සිටි අවධිය දකිනා
පැකිලෙමි පැතුමට මතු භව නිවණා
පින් පල යථාර්ථ ඔබ දත් බැවිනා

වසර දෙකක් ලසුවුයෙන් - සියය ගෙවන්නට වයසින්
යුතු නැත අප දුක් වන්නට - හැඟුම් බරින් ඔබෙ වියොවින්
ලඟකදි ඉපදුන දරුකැල - දෙමුනුපුරන් පවුල් ගසින්
අප නැති කල මතකේ නඟයි - සරණදාස මුත්තානන්

## ප්‍රේමසිරි ගුණතිලක

රෝස්හිල්
සිඩ්නි